

# විල්ලුද හාවා

පරිවර්තනය
හෙල්මලී ගුණතිලක

The Velveteen Rabbit by Margery Williams, Illustrations by William Nicholson Published in 1922, Photo: From the book Velveteen Rabbit- Wikimedia Commons

එක්තරා කාලයක විල්ලුද රෙද්දෙන් නිමවුණු හාවෙක් හිටියා. මුලදී නම් එයා හාවෙක් ඉන්න ඕන විදිහටම හොඳට ලස්සනට, මහතට හිටියා. මේ හාවාට සුදු.දුඹුරු පුල්ලි, ඇත්තම නූල් වලින් නිම වුණු රැවුල් ගස් වගේම රෝස සැටින් රෙද්දෙන් හැඩ වුණු කන් පවා තිබුණා. නත්තල් දවසේ උදේ පිරිමි ළමයාට ලැබෙන්න නියමිත තෑගි පුරවපු මේස් කකුලට මේ හාවා ව දාලා තිබුණේ එයාගේ අත් දෙක මැද්දේ හොලී ඉත්තකුත් රඳවලායි. ඒක හරිම ලස්සන දර්ශනයක් වුණා.

ඒ තෑගි පිරුණු මේස් කකුලේ තව ගොඩාක් දේවල් තිබුණා. කජු පියලි ජාති, දොඩම් ගෙඩි, සෙල්ලම් කෝච්චියක්, චොකලට් ආමන්ඩ් ඇට ටිකක්, යාන්ත්‍රිකව වැඩ කරන සෙල්ලම් මීයෙක් වගේ දේවල් කොයිතරම් තිබුණත් එතැන තිබුණු හොඳම දේ තමයි මේ විල්ලුද හාවා. එදා අඩුම තරමේ පැය දෙකක් වත් ළමයා හාවාට ආදරය කළා. ඊටපස්සේ ඔක්කොම නැන්දලා මාමාලා රෑ කෑමට ආවා, තෑගි දිග ඇරෙන සර සර සද්දේ ඇහුණා. අනෙත් තෑගි ටික බලන්න තිබුණු කලබලයි උනන්දුවයි අතරේ හැමෝටම විල්ලුද හාවා ව අමතක වෙලා ගියා.

ඊටපස්සේ සෑහෙන්න කාලයක් ගතවෙනකම්ම හාවා ජීවත් වුණේ සෙල්ලම් බඩු කාමරයේ අල්මාරියක් ඇතුලේ. කිසිකෙනෙක් එයාව ගණන් ගත්තේ නැහැ. එයා කොහොමත් කුලෑටි නිසාත් විල්ලුද රෙද්දෙන් නිමකරලා තිබුණ නිසාත් අනෙත් මිල වැඩි සෙල්ලම් බඩු නිතරම එයාට ඇනුම් පද කීවා. යාන්ත්‍රික සෙල්ලම් බඩු නම් හිටියේ හරි උඩඟුකමින්. ඒ අයට අලුත් අලුත් අදහස් තිබුණා. ඒ අය තමන්ට පණ තියෙන බවක් මවා පාලා හැම වෙලාවකම අනෙත් සෙල්ලම් බඩු පහත් කරලා සැලකුවා. සෘතු දෙකක්ම තිස්සේ තමන්ගේ ඇඟේ ගාලා තිබුණු තීන්ත වලින් වැඩි හරියක් අහිමි වෙලා තිබුණු සෙල්ලම් බෝට්ටු ආකෘතිය පවා අනෙත් අයගේ පුරසාරම් අහලා පුළුවන් හැමතිස්සෙම තමන්ගේ අංගෝපාංග ගැන කාර්මික නිර්වචන දුන්නා. ලෝකයේ ඇත්තම හාවෝ ඉන්න බව නොදැන හිටිය මේ හාවාට තමන් නම් කිසිම දෙයක අනුරුවක් බව කියන්න විදිහක් තිබුණේ නැහැ. එයා හිතාගෙන හිටියේ අනෙත් හැම හාවෙක්මත් තමන් වගේ ලී කුඩු පුරවලා තිබුණු අය කියලායි. ඒ වගේම ලී කුඩු කියන්නේ බොහොම යල් පැනපු දෙයක් නිසා අලුත් පන්නයේ සමාජ ආශ්‍රයෙදී ඒ ගැන කතා කළ යුතු නැති බවත් එයා දැනගෙන හිටියා. ආබාධිත සොල්දාදුවන්ගේ අතින් නිමවුණු ලී සිංහයා.තිමති. පුළුල් අදහස් දරන කෙනෙක් විය යුතු වුණත් තමන් ආණ්ඩුවට සම්බන්ධ බවක් පෙන්වමින් එයාත් නිතරම හිටියේ හරි උජාරුවෙන්. මේ හැම කෙනාම එකතුවෙලා පුංචි හාවාට තමන් කිසිම වැදගත්කමක් නැති බාල බඩුවක් බව ඒත්තු ගන්නලා තිබුණා. එයාට කරුණාව පෙන්නුවේ හම් අශ්වයා විතරයි.

හම් අශ්වයා අනෙත් හැම කෙනෙකුටම වැඩි කාලයක් සෙල්ලම් බඩු කාමරයේ ජීවත් වෙලා තිබුණා. එයා කොයිතරම් වයසයි ද කියනවා නම් එයාගේ ඇඟේ තැන තැන දුඹුරු ලොම් හැලිලා යටින් තිබුණු මූට්ටුත් මතුවෙලා පෙනුණා. එයාගේ වල්ගයේ නූල්, මාලවල පබළු අමුණන්න උගුල්ලගෙන ගිහින් තිබුණා. ඒත් එයා බොහොම නුවණක්කාරයි. අවුරුදු ගාණක් තිස්සේ යාන්ත්‍රික සෙල්ලම් බඩු මහා සේනාවක් ඇවිත්, උජාරු කතා කියලා, කාලයක් ගිහින් යාන්ත්‍රික දෝෂ ඇතිවෙලා මැරිලා යනවා හම් අශ්වයා හොඳහැටි දැකලා තිබුණා. ඒවා සෙල්ලම් බඩු විතරක් බවත්, කවදාවත් ඊට වැඩි දෙයක් බවට පත්වෙන්නේ නැති බවත් එයා දැනගෙන හිටියා. සෙල්ලම් කාමරයේ බල පැවැත්වුණු මායා බලය හරි අමුතුයි, අපූරු යි. හම් අශ්වයා වගේ කාලයක් තිස්සේ අත්දැකීම් ලබපු වයසක, නුවණක්කාර අයට විතරයි ඒවා ගැන තේරුමක් තිබුණේ.

''පණ ලැබෙනවා කියන්නේ මොකක්ද?''

හාවා දවසක් ඇහුවා. නැනා සෙල්ලම් කාමරය අස්කරන්න එන්න කලින් ඒ දෙන්නා උදුන ඉස්සරහා තිබුණු වැට ළඟ වැතිරිලා හිටියේ.

''ඒ කියන්නේ තමන්ගේ ඇඟ ඇතුලේ සද්ද වෙන මොනවා හරි තියෙන එකටද? දඟ කවන්න යතුරු තියෙන එකද?''

''පණ ලැබෙනවා කියන්නේ තමන්ව හදපු විදිහ නෙමෙයි.'' හම් අශ්වයා කීවා. ''ඒක තමන්ට සිද්ධ වෙන දෙයක්. පුංචි ළමයෙක් තමන්ට සෑහෙන්න කාලයක් තිස්සේ ආදරේ කළා ම, සෙල්ලම් කරන්නම විතරක් නෙමෙයි.ඇත්තටම ආදරේ කළා ම, තමන්ට පණ ලැබෙනවා.''

''එතකොට රිදෙනවාද?'' හාවා ඇහුවා.

''සමහර වෙලාවට'' හම් අශ්වයා නිතරම ඇත්ත කියන නිසා හාවාට ඇත්තම කීවා. ''ඒත් පණ ලැබුණා ම රිදුණා ට ගාණක් නැහැ.''

''ඒක යතුරකින් දඟ කවනවා වගේ එකපාරට වෙනවාද?'' හාවා ඇහුවා. ''-නැත්නම් හෙමින් හෙමින් වෙන දෙයක් ද?''

''ඒක එකපාරට වෙන දෙයක් නෙමෙයි.'' හම් අශ්වයා උත්තර දුන්නා. "තමන් ඒ තත්ත්වයට පත්වෙනවා. ඒකට සෑහෙන්න කාලයක් යනවා. ඒකයි ඉක්මණින් කැඩෙනසුළු අයට, තියුණු දාර තියෙන අයට, පරෙස්සමෙන් බලාගන්න ඕන අයට පණ ලැබෙන්නේ නැත්තේ. සාමාන්‍යයෙන් පණ ලැබෙන කාලේ වෙද්දී ආදරය ලැබිලා ලැබිලා තමන්ගේ කෙස් ඔක්කොම හැලිලා, ඇස් ගැලවිලා, හන්දි බුරුල් වෙලා කොටින්ම කියනවා නම් තමන් හොඳටම කසිකබල් වෙලා. ඒත් ඒ කිසි දෙයක් වැදගත් වෙන්නේ නැහැ. ඒකට හේතුව තමන්ට පණ ලැබුණා ම ආයෙත් කවදාවත් කැත වෙන්නේ නැහැ. එහෙම කැතට පෙනුණත් පේන්නේ මේ සිද්ධ වුණු දේ නොතේරෙන අයට විතරයි.''

"ඔයාට නම් පණ ලැබිලා ඇති නේද?'' හාවා ඇහුවා. ඒත් තමන් එහෙම ඇහුවේ නැත්නම් හොඳයි කියලා එයාට පස්සේ හිතුණේ හම් අශ්වයා ඒ කතාවට ටිකක් සංවේදී ඇති කියලා මතක් වෙලා. ඒත් හම් අශ්වයා හිනා වුණා විතරයි.

"මේ පිරිමි ළමයාගේ මාමා නිසා මට පණ ලැබුණා.'' එයා කීවා. "ඒ නම් අවුරුදු ගණනාවකට ඉස්සර. ඒත් එක සැරයක් පණ ලැබුණා ම ආයෙත් නැතිවෙන්නේ නැහැ. ඒක හැමදාටම යි''

හාවා සුසුමක් හෙලුවා. තමන්ට නම් පණ ලැබෙනවා කියන මායාව සිද්ධ වෙද්දී තව කාලයක් ගතවෙයි කියලා එයාට හිතුණා. එයාට පණ ලබන්න, ඒක අත්විඳින්න ලොකු ආසාවක් තිබුණත් එහෙම වුණොත් තමන් පරණ පාට වෙන එක, ඇස්, රැවුල් ගස් නැතිවෙන එක නම් හරිම දුක හිතෙන වැඩක් කියලාත් හිතුණා. ඒවගේ කරදර නොවී පණ ලබන්න ඇත්නම් කියලා හාවාට හිතුණා.

සෙල්ලම් කාමරය පාලනය කළේ නැනා කියලා කෙනෙක්. සමහරවෙලාවට එයා සෙල්ලම් බඩු හැමතනම විසිරිලා තිබුණු එක ගණන් ගත්තේවත් නැහැ. ඒත් සමහරවෙලාවට කිසිම හේතුවක් නැතිවම එයා සුළි සුළඟක් හමනවා වගේ කලබලෙන් සෙල්ලම් බඩු අල්මාරි වලට වීසි කළා. එයා මේකට කීවේ 'අස් කරනවා' කියලා. සෙල්ලම් බඩු ටික. වැඩියත්ම යකඩින් හැදුව සෙල්ලම් බඩු . මේ අස් කිරිල්ලට ඩිංගක් වත් කැමැත්තක් තිබුණේ නැහැ. හාවට නම් මේක ගාණක් වුණේ නැහැ, ඒ එයා මෙළෙක නිසා කොතැනට වැටුණත් හානියක් වුණේ නැති නිසා.

එක හවසක, පිරිමි ළමයා නිදා ගන්න යද්දී එයා හැමදාම තුරුල් කරගෙන නිදාගත්තු පිඟන් මැටි බල්ලා ව හොයාගන්න බැරි වුණා. නැනා ලොකු හදිස්සියක හිටියේ. නින්දට යන වෙලාව පිඟන් මැටි බල්ලන්ව හොයන්න හොඳ වෙලාවක් නෙමෙයි. එයා වටපිට බලද්දී සෙල්ලම් බඩු අල්මාරියේ දොරක් ඇරලා තියෙනවා දැකලා ඉක්මනට එතැනට ගියා.

"ආ මෙන්න.'' ඈ කීවා. "ඔයාගේ මේ පරණ හාවා ව ගන්න. එයා හොඳයි ඔයාට ළඟ තියාගෙන නිදාගන්න'' එහෙම කියලා ඈ හාවා ව එක කණකින් ඇදලා අරගෙන පිරිමි ළමයාගේ අතට දුන්නා.

එදා රෑත් ඊටපස්සේ එළඹුණු රැයවල් ගණනාවකත් විල්ලුද හාවා පිරිමි ළමයාගේ ඇඳේ නිදාගත්තා. ළමයා එයාව තදට තුරුළු කරගත්ත නිසා, එයාගේ ඇඟ උඩට නින්දෙන්ම පෙරලුණු නිසා, සමහර වෙලාවට එයාව හුස්ම ගන්න බැරිවෙන තරමට කොට්ටය යටට තල්ලු කළ නිසා මුලදී මුලදී හාවාට හරි අපහසුවක් දැනුණා. මුළු ගෙදරම නිශ්ශබ්ද රාත්‍රී කාල වල, හඳ එළිය ඉහිරෙද්දී, සෙල්ලම් බඩු කාමරයේ ඉඳන් හම් අශ්වයා එක්ක කතා බහ කරමින් ගත කළ කාලයට ආයෙත් යන්න ඇත්නම් කියලාත් හිතුණා. ඒත් වැඩි කල් නොගිහින් හාවාට මේ හැමදේටම කැමැත්තක් ඇතිවෙන්න ගත්තා. පිරිමි ළමයා හාවා එක්ක නිතර කතා කළා, ඇඳ රෙදි අතරේ එයාට අපූරු බිංගෙවල් හදලා දුන්නා. එයා කිව්වේ ඒ බිංගෙවල් ඇත්ත හාවෝ ජීවත් වුණු ගුල් වගෙයි කියලා. නැනා උදුනට උඩින් ඇති රාක්කේ පහනක් පත්තු කරලා තියලා රෑ කෑමට ගියාම ඒ දෙන්නා රහස් කියමින් එක එක ඉස්තරම් සෙල්ලම් ජාති කළා. පිරිමි ළමයා ට නින්ද ගියාම හාවා එයාගේ පුංචි උණුහුම් නිකට යටට තුරුල් වෙලා හීන දකින්න පුරුදු වුණා. ළමයා රෑ පුරාම හාවා ව තුරුළු කරගෙන නිදා ගත්තා.

මේ විදිහට කාලය ගත වුණා. හාවා හරිම සතුටින් හිටියේ. කොයිතරම් සතුටින් හිටියාද කියනවානම් තමන්ගේ ලස්සන විල්ලුද ලොම් පරණ වේගෙන යන හැටි දැනුණේ වත් නැහැ. තමන්ගේ වලිගේ මූට්ටු ලෙහිලා ගිය බවත් ළමයා හාදු දුන්නු තැන් වල නහයේ රෝස පාට මැකිලා ගිහින් බවත් තේරුණේ නැහැ.

වසන්තය එළඹුණාම දෙන්නා දවස පුරාම ගෙඋයනේ කාලය ගත කළා. ළමයා යන යන හැමතැනම හාවාත් අරගෙන ගියා. හාවා වීල්බැරෝවේ ගමන් ගියා, තණ බිස්සේ සෙල්ලම් සාද වලට හවුල් වුණා. මල් පාත්ති පිටිපස්සේ රාස්බෙරි පඳුරු අස්සේ හාවාට සුරංගනා කුටි තැනුණා. දවසක් හාවා ව ඇඳිරි වැටෙන වේලාවත් පහුවෙනකම් තණබිස්සේ අමතක වෙලා ගිහින් තිබුණේ ළමයා සෙල්ලම් කර කර ඉන්දැද්දිම එයාට ගමනක් යන්න අඬගහලා තිබුණු නිසා යි. හාවා නැතිව ළමයාට නින්ද යන්නේ නැති නිසා එදා නැනා කළුවරේම ඉටිපන්දමක් අරගෙන හාවා ව හොයන්න ආවා. ඒ වෙද්දී පිණි වැටිලා හාවා තෙත් වෙලා හිටියේ. ළමයා හදලා දුන්නු ගුල් වල රිංගලා ඇඟේ හැමතැනම පස් ගෑවිලාත් තිබුණා. නැනා මැසිවිලි කිය කියා තමන්ගේ ඇඳුමේ කොණකින් හාවා ව පිහිදැම්මා.

"ඔයා මේ පරණ හාවා ව ඕනෙමයි කියන හැටි!'' ඈ ළමයාට කීවා. "සෙල්ලම් බඩුවක් වෙනුවෙන් මේ තරම් කලබලයක්!''

පිරිමි ළමයා දෑත පාලා ඇඳ උඩ වාඩිවෙලා හිටියා.

"දෙන්න මගේ හාවා ව!'' එයා කීවා. "එහෙම කියන්න එපා. එයා සෙල්ලම් බඩුවක් නෙමෙයි. එයාට පණ තියෙනවා!''

ඒක ඇහුණාම හාවාට හරි සතුටක් දැනුණා. හම් අශ්වයා කීව දේ ඇත්ත බව එයාට තේරුණා. සෙල්ලම් බඩු කාමරයේ මායාවට නතුවෙලා තමන් දැන් තවදුරටත් සෙල්ලම් බඩුවක් විතරක් නෙමෙයි. තමන්ට පණ ලැබිලා... ඒ බව කීවේ පිරිමි ළමයාමයි!

එදා රෑ සන්තෝසය වැඩි කමට හාවාට නින්ද ගියේත් නැහැ. එයාගේ පුංචි ලී කුඩු හදවත පුපුරලා යන තරමට ආදරයෙන් පිරිලා ගියා. බොහොම කාලෙකට ඉස්සර දිස්නය නැති වුණු හාවාගේ බොත්තම් ඇස් දෙක අමුතුම ලස්සනකින්, නුවණක්කාර බවකින් හැඩ වුණා. මේ වෙනස කොයිතරම් ද කියනවානම් ඊළඟ දවසේ උදේ නැනා හාවා ව අතට ගනිද්දී හාවාගේ අමුත්තක් දැක්කා. "මේ හාවාගේ මූණේ තියෙනවා නිකම් හැමදේම දන්නවා වගේ පෙනුමක්'' ඈ කීවා.

38 වන පිටට